# ඇබෑර්තු

## උපදේශක පදනමින්

## ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම

### දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

## වාරිමාර්ග අමාත්‍යාංශය

හරිත දේශගුණ අරමුදල (GCF) විසින් අරමුදල් සපයනු ලබන හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) විසින්, සුදුසුකම්ලත් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකිකයන් වෙතින්, අදාළ CRIWMP ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් තනතුරු සඳහා, **"තාවකාලික පදනමින්"** උපදේශක පැවරුම් ලෙස එම ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) සේවය ලබාදීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ ව්‍යාපෘතිය පරිපාලන දිස්ත්‍රික්ක හතක් ආවරණය වන පරිදි මී ඔය මල්වතුඔය හා යාන් ඔය ද්‍රෝණි සම්බන්ධව ක්‍රියාත්මක කෙරේ.

අදාළ අයදුම්කරුවන් වයස අවුරුදු 65 ට අඩු වියයුතු අතර, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, රජයේ රෙගුලාසි සම්බන්ධව හුරුපුරුදුභාවය හා පරිගණක සාක්ෂරතාව අපේක්ෂිත පූර්වාවශ්‍යතාවන් වේ. එයට අමතරව අදාළ තනතුරට අදාළ වසර තුනක (03) කාර්ය පළපුරුද්ද අවශ්‍ය වේ. විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකම් වේ. වැටුප් ගෙවීම අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සිදුකරනු ලබන අතර, අදාළ චක්‍රලේඛයෙහි නිර්දිෂ්ඨ වැටුපට අමතරව ජීවන අංක දීමනාවද ගෙවනු ලැබේ.

### 1. සහකාර ව්‍යාපෘති ගණකාධිකාරී - PS5 තලය - කොළඹ ස්ථානගත තනතුරු 01

**අවශ්‍ය සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් මූල්‍ය/ වාණිජ්‍ය/ කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ උපාධියට සමාන සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක CA/ CIMA/ACCA/AAT විභාගවල අර්ධ සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක සමාන වෘත්තීය සුදුසුකම් සමග කළමනාකරණ තලයේ, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වරස 03 ක පළපුරුද්ද.

### 2. සහකාර ප්‍රසම්පාදන විශේෂඥ - PS5 තලය කොළඹ ස්ථානගත තනතුරු 01

**අවශ්‍යය සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ උපාධියට සමාන වෙනත් සුදුසුකම් සහ ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයෙන් ලබාගත් මිලදී ගැණුම් හා සැපයුම් දම කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධි ඩිප්ලෝමාවක් සමග කළමනාකරණ තලයේ අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

### අයදුම්පත්

අයදුම්කරුවන් විසින්, තම ජීවදත්ත, අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද විස්තර ඇතුළත් අයදුම්පත්, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග යොමු කළ යුතුවේ. ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද සහිත කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, තෝරා ගැනීම සුදුසුකම් මත පදනම්ව සිදු කෙරේ. මූලික සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතු අතර, සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රජයේ/ අර්ධ රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු වේ.

අයදුම්පත්, ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2024 ජූනි 20 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ජාතික ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)**
**වාරිමාර්ග අමාත්‍යාංශය,**
**අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.**
**දිනය : 2024.06.06**